# (ඉ) ගෙවුම් ශේෂය සහ විදේශ වත්කම්

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂය සහ විදේශ වත්කම් පිළිබඳ සවිස්තර සංඛ්‍යා දෙවැනි පරිශිෂ්ඨයේ 44 සිට 48 දක්වා සංඛ්‍යා සටහන්හි දක්වේ. ගෙවුම් ශේෂ දත්තයන් ප්‍රධාන වශයෙන් පිළියෙල කර ගනු ලබන්නේ වර්ෂය තුළවූ නියම ගෙවීම් සහ ලැබීම් පිළිබඳ විනිමය වාර්තා ඇසුරෙනි. මෙයට අතිරේක වශයෙන් ක්‍රම සම්පාදන සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය සහ ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වැනි අනෙකුත් මූලාශ්‍රවලින් ලබාගන්නා තොරතුරුද උපයෝගී කොට ගනු ලැබේ. මෙම සංඛ්‍යා, විදේශ වෙළඳුම් අංශයේ භාවිත කෙරෙන රේගු වාර්තා මතම පදනම්වූ සංඛ්‍යා ලේඛන වලින් වෙනස් විය හැකිය.

තාවකාලික ඇස්තමේන්තු අනුව ශ්‍රී ලංකාවේ වර්තන ජාත්‍යන්තර ගනුදෙනුවල ශේෂයෙහි 1972 දීවූ රුපියල් 1960 ලක්ෂයක හිඟය හා සසඳන කල්හි එම හිඟය 1973 දී රුපියල් 1610 ලක්ෂයක් විය. මෙය 1965 සිට දක්නට ලැබුණු වෙළඳ අනුපාතයේ අඩුවීමේ උපනතිය හා සමාන්තරව ගමන් කරයි. ආයාත සපයන රටවල උද්ධමනී තත්ත්වය සහ සැපයීම් බාධකයන් නිසාත් ජාත්‍යන්තර මූල්‍ය තත්ත්වයේ අවිනිශ්චිත භාවය නිසාත් 1972 සහ 1973 වර්ෂවල ආයාත සඳහා වේගයෙන් මිළ ඉහළ යාමක් සිදුවිය. එසේ නොවූයේ නම් 1973 වර්ෂයේ හිඟය දැනට වඩා සැලකියයුතු ලෙස අඩුවීමට ඉඩ තිබුණි. කෙසේ වුවද 1973 ගෙවුම් ශේෂ තත්ත්වය 1970 සිටම පැවත ආ විදේශ ගිණුමෙහි තත්ත්වය තව-දුරටත් වැඩි දියුණුවීමකි. මෙසේ නොකඩවා පැවති වැඩි දියුණුවීම දැඩි ආයාත පාලනයේ සහ ගෙවීම් සීමා කිරීමේ ප්‍රතිඵලයක් මිස දේශීය ඉල්ලුමෙහි අඩුවීමක් නිසා වූවක් නොවන බව පැහැදිලිවේ. ගෙවුම් ශේෂයෙහි ජංගම ගිණුමේ ප්‍රධාන සංයුතිය වන වෙළඳ භාණ්ඩ ගිණුමේ 1972 දී රුපියල් 2550 ලක්ෂයක හිඟයක්වූ අතර 1973 දී එම හිඟය රුපියල් 2990 ලක්ෂයක් විය. එසේ වුවද අදෘශ්‍ය ගිණුමෙහි 1972 වර්ෂයේවූ රුපියල් 590 ලක්ෂයක අතිරික්තය 1973 දී රුපියල් 1380 ලක්ෂය දක්වා තියුණු ලෙස වැඩිවීම නිසාම වර්තන ගිණුමෙහි හිඟය රුපියල් 1610 ලක්ෂය දක්වා අඩුවිය.

### II (ඉ) 1 වැනි සංඛ්‍යා සටහන

### ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂය

රුපියල් දශ ලක්ෂ

| වර්ෂය | වෙළෙඳ ශේෂය | සංක්‍රාම ගෙවුම් ඇතුළුව ශුද්ධ සේවා | ජංගම ගිණුමේ ශේෂය | ශුද්ධ දිගුකාලීන ප්‍රාග්ධනය | මූලික ශේෂය |
|---|---|---|---|---|---|
| 1957 | − 95 | − 100 | − 195 | − 18 | − 213 |
| 1958 | − 89 | − 64 | − 153 | + 8 | − 145 |
| 1959 | − 183 | − 25 | − 208 | + 32 | − 176 |
| 1960 | − 210 | − 11 | − 221 | + 22 | − 199 |
| 1961 | − 86 | − 7 | − 93 | + 11 | − 82 |
| 1962 | − 143 | + 3 | − 140 | + 39 | − 101 |
| 1963 | − 161 | − 7 | − 168 | + 80 | − 88 |
| 1964 | − 193 | + 33 | − 160 | + 8 | − 152 |
| 1965 | − 13 | + 72 | + 59 | + 58 | + 117 |
| 1966 | − 344 | + 54 | − 290 | + 137 | − 153 |
| 1967 | − 335 | + 46 | − 289 | + 161 | − 128 |
| 1968 | − 380 | + 25 | − 355 | + 224 | − 131 |
| 1969 | − 746 | − 51 | − 797 | + 275 | − 522 |
| 1970 | − 315 | − 35 | − 350 | + 184 | − 166 |
| 1971 | − 287 | + 71 | − 216 | + 404 | + 188 |
| 1972 | − 255 | + 59 | − 196 | + 292 | + 96 |
| 1973(අ) | − 299 | + 138 | − 161 | + 195 | + 34 |

(අ) තාවකාලිකයි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**1972 - 1973**

| | රුපියල් | | |
|---|---|---|---|
| | | 1 9 7 2 | |
| | හර | බැර | ශුද්ධ |
| **1. වෙළෙඳ ගිණුම** | | | |
| අපනයන (නැ·වි·ස·) .. .. .. | 1,898 | | |
| ආනයන (මි·ර·ගැ·) (ස්ව සම්පත්) .. .. | | 1,599 | |
| (ආධාර ආනයන සහ සැපයුම් කරුවන්ගේ ණය) .. | | 554 | |
| මුළු ආනයන .. .. .. | | 2,153 | |
| වෙළෙඳ ශේෂය (ස්ව සම්පත්) .. .. | | | (+ 299) |
| වෙළෙඳ ශේෂය (සියලුම ආනයන) .. .. | | | − 255 |
| **2. සේවා ගිණුම** | | | |
| මූල්‍ය නොවන රන් .. .. | — | — | — |
| වරාය, ප්‍රවාහණ සහ රක්ෂණ .. .. | 154 | 61 | + 93 |
| විදේශ සංචාර .. .. | 28 | 12 | + 16 |
| ආයෝජන ආදයම් .. .. | 10 | 125 | − 115 |
| (i) ලාභ සහ ලාභාංශ .. .. | 1 | 23 | − 22 |
| (ii) අනෙකුත් (පොලී) .. .. | 9 | 102 | − 93 |
| රජයේ වියදම් .. .. | 33 | 20 | + 13 |
| විවිධ සේවා .. .. | 83 | 105 | − 22 |
| පෞද්ගලික සංක්‍රාම .. .. | 24 | 50 | − 26 |
| මුළු සේවා .. .. | 332 | 373 | − 41 |
| **3. මුළු ජංගම ගිණුම (ස්ව සම්පත්)** .. .. | (2,230) | (1,972) | (+ 258) |
| **මුළු ජංගම ගිණුම (සියළුම ශීෂ)** .. .. | 2,230 | 2,526 | − 296 |
| **4. ප්‍රාග්ධන ගෙවීම්** .. .. | — | 995 | − 995 |
| ණය .. .. | — | 125 | − 125 |
| සැපයුම්කරුවන්ගේ ණය .. .. | — | 84 | − 84 |
| කෙටිකාලීන ණය .. .. | — | 570 | − 570 |
| තෙල් වන්දි සහ ආසියානු සංවර්ධන බැංකුව .. .. | — | — | − — |
| පෞද්ගලික ප්‍රාග්ධනය .. .. | — | 8 | − 8 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල .. .. | — | 170 | − 170 |
| බැංකු ණය .. .. | — | — | − — |
| අනෙකුත් .. .. | — | 38 | − 38 |
| මුළු ජංගම හා ප්‍රාග්ධන ගෙවීම් (ස්ව සම්පත්) .. .. | | | (− 737) |
| මුළු ජංගම හා ප්‍රාග්ධන ගෙවීම් (සියලුම ශීෂ) .. | | | −1,291 |
| **5. මුදල් සැපයීම** .. .. | | | |
| ජා. මූ. අ. හැර ගැනීම . .. | 163 | — | + 163 |
| බැංකු ණය .. .. | 12 | — | + 12 |
| ද්විපාර්ශ්වික ශේෂ .. .. | — | 11 | − 11 |
| සැපයුම්කරුවන්ගේ ණය .. .. | 52 | — | + 52 |
| කෙටි කාලීන ණය .. .. | 593 | — | + 593 |
| විදේශ වත්කම් .. .. | — | 229 | − 229 |
| ද්‍රව්‍යාධාර .. .. | 304 | — | + 304 |
| යෝජනාක්‍රම හා වෙනත් ආධාර .. .. | 98 | — | + 98 |
| වෙනත් ආධාර .. .. | 13 | — | + 13 |
| පරිත්‍යාග .. .. | 100 | — | + 100 |
| පෞද්ගලික ප්‍රාග්ධනය .. .. | 10 | — | + 10 |
| අනෙකුත් .. .. | 107 | — | + 107 |
| විශේෂ හැර ගැනීමේ අයිතීන් .. .. | 62 | — | + 62 |
| වැරදීම් හා අත්හැරීම් .. | 17 | — | + 17 |
| මුළු මුදල් සැපයීම .. .. | 1,531 | 240 | +1,291 |

(අ) තාවකාලිකයි.

සංඛ්‍යා: කිට්ටුම පූර්ණ සංඛ්‍යා වලින් දක්වා ඇත.

II (උ) 2 සංඛ්‍යා සටහන

## ගෙවුම් ශේෂය

| දශ ලක්ෂ | | | එ. ජ. ඩොලර් දශ ලක්ෂ | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 1973 (අ) | | | 1972 | | | 1973 (අ) | | |
| හර | බැර | ශුද්ධ | හර | බැර | ශුද්ධ | හර | බැර | ශුද්ධ |
| 2,346 | | | 308 | | | 368 | | |
| | 1,986 | | | 259 | | | 312 | |
| | 658 | | | 90 | | | 103 | |
| | 2,644 | | | 349 | | | 415 | |
| | | (+ 360) | | | (+ 49) | | | |
| | | − 298 | | | − 41 | | | |
| — | — | — | — | — | — | | | |
| 177 | 62 | + 115 | 25 | 10 | + 15 | 28 | 10 | + 18 |
| 59 | 10 | + 49 | 5 | 2 | + 3 | 9 | 2 | + 7 |
| 17 | 127 | − 110 | 2 | 21 | − 19 | 3 | 20 | − 17 |
| 1 | 19 | − 18 | — | 4 | − 4 | — | 3 | − 3 |
| 16 | 108 | − 92 | 2 | 17 | − 15 | 3 | 17 | − 14 |
| 33 | 20 | + 13 | 5 | 3 | + 2 | 5 | 3 | + 2 |
| 103 | 115 | − 12 | 13 | 17 | − 4 | 16 | 18 | − 2 |
| 48 | 46 | + 2 | 4 | 8 | − 4 | 8 | 7 | + 1 |
| 437 | 380 | + 57 | 54 | 61 | − 7 | 69 | 60 | + 9 |
| (2,783) | (2,366) | (+ 417) | (362) | (320) | (+ 42) | (437) | (372) | (+ 65) |
| 2,783 | 3,024 | − 241 | 362 | 410 | − 48 | 437 | 475 | − 38 |
| — | 1277 | −1277 | — | 161 | −161 | — | 201 | −201 |
| — | 141 | − 141 | — | 20 | − 20 | — | 22 | − 22 |
| — | 95 | − 95 | — | 14 | − 14 | — | 15 | − 15 |
| | 644 | − 644 | — | 92 | − 92 | — | 101 | −101 |
| — | — | — | — | — | — | — | — | — |
| — | 5 | − 5 | — | 1 | − 1 | — | 1 | − 1 |
| — | 169 | − 169 | — | 28 | − 28 | — | 27 | − 27 |
| — | 112 | − 112 | — | — | — | — | 18 | − 18 |
| — | 111 | − 111 | — | 6 | − 6 | — | 17 | − 17 |
| | | (− 860) | | | (−119) | | | (−136) |
| | | −1,518 | | | −209 | | | −239 |
| 137 | — | + 137 | 26 | — | + 26 | 21 | — | + 21 |
| — | — | — | 2 | — | + 2 | — | — | + — |
| 1 | — | + 1 | — | 2 | − 2 | — | — | − — |
| 240 | — | + 240 | 8 | — | + 8 | 38 | — | + 38 |
| 781 | — | + 781 | 96 | — | + 96 | 123 | — | +123 |
| — | 125 | − 125 | — | 37 | − 37 | — | 20 | − 20 |
| 210 | — | + 210 | 49 | — | + 49 | 33 | — | + 33 |
| 125 | — | + 125 | 16 | - | + 16 | 20 | — | + 20 |
| — | — | — | 2 | — | + 2 | — | — | — |
| 83 | — | + 83 | 16 | — | + 16 | 13 | — | + 13 |
| 6 | — | + 6 | 2 | — | + 2 | 1 | — | + 1 |
| 48 | — | + 48 | 18 | — | + 18 | 8 | — | + 8 |
| — | — | — | 10 | — | + 10 | — | — | — |
| 12 | — | + 12 | 3 | — | + 3 | 2 | — | + 2 |
| 1,643 | 125 | +1,518 | 248 | 39 | +209 | 259 | 20 | +239 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ගෙවුම් ශේෂයේ වර්තන ගිණුමෙහි හිඟය ආර්ථිකය කෙරෙහි බලපෑ අයුරු අගැයීමේදී විශේෂයෙන්ම සලකා බැලිය යුත්තේ හිඟය පියවූ ආකාරයයි. අවශ්‍ය ප්‍රමාණයක විදේශ විනිමය සංචිත නොමැති අවස්ථාවකදී හිඟය පියවීම් සඳහා උපයෝගී කොට ගත හැකි ඉතා සුදුසු මාර්ගය දිගු කාලීන ප්‍රාග්ධන ගලා ඒමය. 1973 දී මෙවැනි ගලා ඒම මෙම හිඟය සමහන් කිරීමට අවශ්‍ය ප්‍රමාණයටත් වඩා වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් සමස්ථ ශේෂයෙහි රුපියල් 360 ලක්ෂයක අතිරික්තයක් විය. මෙවැනි වාසිදයක ශේෂයක් තිබිය-දීත් කෙටිකාලීන ණය ලබා ගැනීම් මත ශ්‍රී ලංකාවේ රැඳියාව අඩුවීමක් ඇති වී නොමැත. ඇත්ත වශයෙන්ම සිදුවී ඇත්තේ කෙටිකාලීන ණය සහ සැපයුම්කරුවන්ගේ ණය ප්‍රමාණය (ණය හිලව් කිරීම් වලට අමතරව) රුපියල් ලක්ෂ 2820 කින් වැඩිවීමයි. කෙසේ වුවත් මෙම මූල්‍ය පහසුකම් සැපයීමේ මූලාශ්‍රය නිසා විදේශ බැංකු වගකීම්වල (රුපියල් ලක්ෂ 1120 ක) අඩුවීමට අමතරව විදේශීය වත්කම්හි (රුපියල් ලක්ෂ 1250 ක) සාමාන්‍ය වැඩි-වීමක් අත් කර ගැනීමට ශ්‍රී ලංකාව සමත් විය.

### උපනතීන් පිළිබඳ විස්තර

#### (අ) වෙළඳ භාණ්ඩ ගිණුම

1973 දී ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂයේ වෙළඳ ගිණුම රුපියල් 2990 ලක්ෂයක හිඟයක් සනිටුහන් කළේය. මෙය 1972 තත්ත්වයේ සිට තවදුරටත් පිරිහීමක් ලෙස පෙනුනද වර්ෂය සඳහාවූ සංඛ්‍යාව අවුරුද්ද මැදදී ඇරඹී අවුරුද්දේ ඉතිරි කාලය තුළ ශක්තිමත්ව අඛන්ඩව පැවති නිර්යාත ඉපැයීම්වල කැපී පෙනෙන ඉහළ නැගීම වසන් කරයි. ප්‍රධාන වශයෙන් ආනයන මට්ටම් පාලනය කෙරුණේ, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය පරිභෝජනයේ යම් තීරණාත්මක අවම මට්ටම් සහතික කිරීමේ අවශ්‍යතාවය විසිනුත්, රාජ්‍ය හා පුද්ගලික කර්මාන්තවලට අමු ද්‍රව්‍ය ආදිදේ සෑහෙන ප්‍රමාණයක් ලබා ගැනීමට ඉඩ සැලසීම තුළින් විශාල ලෙස නිෂ්පාදන හා සේවා කප්පාදුවක් නිෂ්පාදන කර්මාන්ත තුළ ඇතිවීම වැළැක්-වීමේ අවශ්‍යතාවය විසිනුත්ය. හිඟයෙන් පහෙන් හතරකට වැඩි ප්‍රමාණයක් (රුපියල් 2700 ලක්ෂයක්) අවුරුද්දේ මුල් භාගය තුළ සිදුවූ අතර එයට ප්‍රතිවිරුද්ධව තුන් වැනි සහ හතර වැනි කාර්තුවල දී අපනයන හා ආනයන අතර තුලනතාවයකට ආසන්න තත්ත්වයක් පැවතුණි.

1973 වෙළඳ භාණ්ඩ ගිණුමෙහි කැපී පෙනෙන ලක්ෂණය වූයේ අපනයන ඉපයීම් තුළ මෑතකදී දක්නට ලැබුණු එකතැන රැඳි සිටීමේ උපනතියෙන් මිදීමයි. පසුගිය පස් වසර තුළ පැවති සාමාන්‍යයට වඩා මෙම වර්ෂයේ අපනයන ආදයම සියයට 17 කින් රුපියල් 23460 ලක්ෂය දක්වා වැඩිවිය. අපනයනයන් හැකිලුනු ස්වභාවයක පැවති පසුගිය වසර කීපය හා සසඳන විට මෙකී අපනයන ඉහළ යාම, කැපී පෙනෙන වෙනසක් පෙන්නුම් කරයි. සම්ප්‍රදායික අපනයන අතරින් තේ සහ රබර්ද අනෙකුත් සියළුම සුළු අපනයනයන්ද මෙම වෙනසට දයක විය.

ප්‍රධාන අපනයන අතුරින් රබර් සහ පොල් නිෂ්පාදිතයන්, 1973 දී දක්නට ලැබුණු ලෝක භාණ්ඩ මිළ උත්පාතයට ඇතුළු වූ කොටස් විය. කෙසේ වුවද ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයනය වන තේ ලෝක භාණ්ඩ මිළ උත්පාතයෙන් වාසි ලබා නොගත් භාණ්ඩ කීපය අතුරින් එකක් විය. එසේ වුවද තේවලින් ලද ඉපැයීම් 1972 දී වූ රුපියල් 9830 ලක්ෂය (විනිමය වාර්තා අනුව) සිට 1973 දී ඇස්තමේන්තු කරන ලද රුපියල් 10690 ලක්ෂයක් දක්වා වැඩිවෙමින්, අපනයන ආදයමේ සමස්ථ වැඩිවීමකට දයක විය. මෙම වැඩිවීම මුළුමනින්ම අපනයනය කරන ලද ප්‍රමාණයේ වැඩිවීම හේතු කොටගෙන සිදුවූවකි. සාමාන්‍ය නෑ. වි. ස. මිළ රාත්තලක් ශත 93 ක් දක්වා අඩුවීම් හේතුකොටගෙන, 1972 දී විශේෂයෙන්ම පහත වැටුණු රබර් මිළ 1973 දී ඉතා ඉක්මනින් යථා තත්ත්වයට පත් විය. ඇත්ත වශයෙන්ම රබර් මිළ ඉහළ යාම ඇරඹුනේ 1972 අවසාන මාස කීපය තුළදීය. 1973 මුළුල්ලේම මිළ ඉහළ යමින් දෙසැම්බරයේදී රාත්තලක නෑ. වි. ස. මිළ රුපියල් 2·69 දක්වා තියුණු ලෙස ඉහළ ගියේය. ඉකුත් වර්ෂයේ ඉපයුම්වූ රුපියල්

## II (ඌ) 3 සංඛ්‍යා සටහන

### විදේශීය සම්පත් සහ ඒවා යෙදවූ අයුරු

| ශීර්ෂ | රුපියල් දශ ලක්ෂ | | | | ප්‍රතිශත කොටස | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1970 | 1971 | 1972 | 1973(අ) | 1970 | 1971 | 1972 | 1973(අ) |
| **අ. සම්පත්** | | | | | | | | |
| 1. වෙළඳ භාණ්ඩ අපනයන (නැ.වි.ස.) .. | 2,017 | 1,930 | 1,898 | 2,346 | 58 | 51 | 51 | 53 |
| 2. සේවා ගිණුම .. | 234 | 333 | 332 | 437 | 7 | 9 | 9 | 10 |
| 3. ප්‍රාග්ධන ලැබීම් .. | 382 | 628 | 525 | 424 | 11 | 16 | 14 | 10 |
| (අ) ණය[1] .. | 299 | 346 | 402 | 335 | 9 | 9 | 11 | 8 |
| (ආ) වෙනත් ආධාර[2] .. | — | 152 | 13 | — | — | 4 | — | — |
| (ඇ) පරිත්‍යාග[1] .. | 75 | 105 | 100 | 83 | 2 | 3 | 3 | 2 |
| (ඈ) පෞද්ගලික ප්‍රාග්ධන . | 8 | 25 | 10 | 6 | — | — | — | — |
| 4. කෙටිකාලීන වගකීම් .. | 829 | 903 | 989 | 1,207 | 24 | 24 | 26 | 27 |
| (අ) ජා. මු. අ. හැර ගැනීම් (දළ) .. | 57 | 83 | 163 | 137 | 2 | 2 | 4 | 3 |
| (ආ) විශේෂ හැර ගැනීමේ අයිතීන් .. | 78 | 63 | 62 | — | 2 | 2 | 2 | |
| (ඇ) ද්විපාර්ශ්වික ගෙවුම් සම්මුති ශේෂවල වැඩිවීම් .. | — | — | — | 1 | — | — | — | — |
| (ඈ) විදේශ බැංකු වලින් ගැනීම් .. | 123 | — | 12 | — | 4 | — | — | — |
| (ඉ) කෙටිකාලීන ණය .. | 434 | 658 | 593 | 781 | 13 | 17 | 16 | 18 |
| (ඊ) සැපයුම්කරුවන්ගේ ණය .. | 85 | 58 | 52 | 240 | 2 | 2 | 1 | 5 |
| (උ) වෙනත් .. | 52 | 41 | 107 | 48 | 1 | 1 | 3 | 1 |
| 5. (රන් පවුම් ණය නිදන් අරමුදල හැර) විදේශ වත්කම් අඩුවීම .. | — | — | — | — | — | — | — | — |
| **එකතුව ..** | **3,462** | **3,794** | **3,744** | **4,414** | **100** | **100** | **100** | **100** |
| **ආ. යෙදවූ අයුරු** | | | | | | | | |
| 6. වෙළඳ භාණ්ඩ ආනයන (මි.ර.ගැ.) .. | 2,332 | 2,217 | 2,153 | 2,644 | 67 | 58 | 58 | 60 |
| ඒවායින්-ආධාර .. | 459 | 509 | 554 | 658 | 13 | 13 | 15 | 15 |
| 7. සේවා ගිණුම .. | 364 | 367 | 373 | 380 | 11 | 10 | 10 | 9 |
| (අ) ආයෝජන ආදායම .. | 152 | 134 | 125 | 127 | 4 | 3 | 3 | 3 |
| (ආ) සංක්‍රමණික සංක්‍රාම .. | 23 | 40 | 50 | 46 | 1 | 1 | 1 | 1 |
| 8. ප්‍රාග්ධන ගෙවීම් .. | 126 | 132 | 133 | 146 | 3 | 3 | 4 | 3 |
| (අ) නිල .. | 113 | 96 | 125 | 141 | 3 | 2 | 3 | 3 |
| (ආ) පෞද්ගලික .. | 13 | 36 | 8 | 5 | — | 1 | 1 | — |
| 9. කෙටිකාලීන වගකීම් .. | 605 | 976 | 873 | 1,131 | 18 | 26 | 22 | 25 |
| (අ) ජා. මු. අ. ප්‍රතිමිලට ගැනීම් .. | 161 | 145 | 170 | 169 | 5 | 4 | 5 | 4 |
| (ආ) ද්විපාර්ශ්වික ගෙවුම් සම්මුති ශේෂවල අඩුවීම් .. | 75 | 57 | 11 | — | 2 | 2 | — | 2 |
| (ඇ) බැංකු ණය .. | — | 81 | — | 112 | — | 2 | — | 3 |
| (ඈ) කෙටි කාලීන ණය .. | 282 | 614 | 570 | 644 | 8 | 16 | 15 | 15 |
| (ඉ) සැපයුම් කරුවන්ගේ ණය .. | 80 | 65 | 84 | 95 | 3 | 2 | 2 | 2 |
| (ඊ) වෙනත් .. | 7 | 14 | 38 | 111 | — | — | — | 3 |
| 10. (රන්පවුම් ණය නිදන් අරමුදල් හැර) විදේශ වත්කම් වැඩිවීම .. | 39 | 89 | 224 | 121 | 1 | 2 | 6 | 3 |
| 11. සමතුලිත ශේෂය .. | – 4 | 13 | – 12 | – 8 | — | — | — | — |
| **එකතුව ..** | **3,462** | **3,794** | **3,744** | **4,414** | **100** | **100** | **100** | **100** |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලිකයි

1. යෝජනාක්‍රම ආධාර සහ ද්‍රව්‍යාධාරවල ආරූපයෙන් ලැබුණු ආධාර ඇතුලත්වේ.
2. මහජන චීන සමූහාණ්ඩුවෙන් ලැබුණ ව්‍යවහාර මුදල් ණය.

සංඛ්‍යා කිට්ටුම පූර්ණ සංඛ්‍යාවලින් දක්වා ඇත.

2990 ලක්ෂය හා සැසඳීමේදී 1973 දී රබර්වලින් ලද සමස්ථ ඉපැයුම රුපියල් 5190 ලක්ෂයක් යයි ඇස්තමේන්තු කර ඇත. වැඩිවූ ඉපැයීම්වලින් විශාල කොටසක් ඉහළ මිළයන් නිසා සිදුවූ අතර, නැව්ගත කිරීමේ ප්‍රමාණය වැඩිවීමද තවත් හේතුවක් විය. මූලික ද්‍රව්‍ය නිෂ්පාදිතයන්හි මිළ ඉහළ යාමේ උපනතියට එකඟව 1973 දී පොල් මිළද සීඝ්‍රයෙන් ඉහළ ගිය නමුත් අපනයනයන් කෙරෙහි පැනවූ යම් සීමාවන් නිසා මෙම වර්ෂයේදී පොල් නිෂ්පාදිතවලින් ලද ඉපැයුම් පහත වැටුණි. 1973 අප්‍රේල් 9 ද සිට ක්‍රියාත්මකවූ පොල් තෙල් අපනයනය කිරීම අත්හිටුවීම නිසා (මෙය දෙසැම්බර් පළමු වෙනිද සිට තරමක් ලිහිල් කරන ලදි.) පොල් තෙල් අපනයන කිරීම සම්පූර්ණයෙන්ම ඇන හිටයේය. කොප්පරා සම්බන්ධයෙන් පෙබරවාරි 15 ද සිට පනවන්නට යෙදුන සම්පූර්ණ අපනයන අත්හිටුවීම වර්ෂය මුළුල්ලේම පැවතුණි. මෙම අපනයන අත්හිටවූයේ පෙර වර්ෂයේ පැවැති නියඟය නිසා පොල් නිෂ්පාදනය බෙහෙවින් පහත වැටීම හේතු කොටගෙන දේශීය පරිභෝජනය සඳහා ප්‍රමාණවත් සැපයීම් කිරීමට වග බලා ගත යුතුවූ නිසාය. මේ නිසා 1973 නිර්යාත කළ පොල් නිෂ්පාදනවලින් වැඩි කොටසක් කපාපු පොල් විය.

සුළු අපනයන අතරින් වටිනා සහ ඉතා වටිනා ගල් වර්ග, පොල් තෙල් හැර අනෙකුත් පොල් න්ෂ්පාදන, කපාපු පොල් සහ කොප්පරා, අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදන කාර්මික භාණ්ඩ සහ නැව්වලට තෙල් සැපයීමේ ආදයම් මීට පෙර වර්ෂවලට වඩා විශාල ලෙස වැඩිවී ඇත. විශේෂයෙන්ම, වටිනා හා ඉතා වටිනා ගල් වර්ග 1972 පැවති රුපියල් 80 ලක්ෂයේ සිට 1973 දී 1300 ලක්ෂයක් දක්වා වැඩිවිය.[1] මැණික් මෙන්ම අනෙකුත් සුළු අපනයනයන්හි පරිමාව හා මිළ වැඩිවීම හේතුකොට-ගෙන ඒවායේ ඉපැයීම් වැඩිවිය. මෙකී අංශයට සළසා ඇති නොයෙකුත් දිරිගැන්වීම් අපනයන පරිමාවේ වැඩිවීමට හේතුව ලෙස දක්විය හැක. උදහරණ වශයෙන් විවිහිස මගින් ලැබෙන සියයට හැටපහක ප්‍රතිලාභයක් සඳහා සියළුම සුළු අපනයන කරුවන් හිමිකම් පෑහ. මීට අමතරව මැණික් අපනයන, ආදයම් බදු සහන ලැබීමටද එම ඉපැයුම්වලින් 25% ක් පරිවර්ත්‍ය රුපියල් ගිණුම් පවත්වා ගැනීමටද සුදුසුකම් ලබා ඇත. අනෙකුත් සියළුම සුළු ආයාත සඳහා සියයට දෙකක පරිවර්තික ගිණුම් පහසුව සළසා ඇත.[2] තවද්‍යුරටත් කාර්මික අපනයනයන් ඊට අවශ්‍ය අමු ද්‍රව්‍ය ආනයනය කිරීමේදී ගෙවූ තීරු බදු ආපසු ලබා ගැනීමේ පහසුකමට හිමි-කම් කිය. කෙසේ වුවද සුළු කෘෂිකාර්මික අපනයන ඉපැයීම් වැඩිවීම, කෘෂි ද්‍රව්‍ය සඳහා පැවති අධික ඉල්ලුම නිසා සිදුවූ මිළ උත්පාතය නිසා වූවක් බව සඳහන් කළ යුතුය.

රුපියල් අපනයන ඉපැයුම් කෙරෙහි බලපෑ එක් හේතුවක් වශයෙන් සඳහන් කළ යුත්තේ විනිමය අනුපාතිකයන්හි නිතර ඇතිවූ වෙනස්කම්ය. සාමාන්‍යයෙන් විනිමය අනුපාතිකය පහත වැටෙන විට, අපනයන ලැබීම්හි විදේශීය මුදල් වටිනාකම ඉහළ යාමක් නොමැතිව දේශීය ලැබීම් ඉහළ යාමේ උපනතියක් දක්වයි. 1973 දී නිතර දක්නට ලැබුණු විනිමය අනුපාතිකය වෙනස්වීම් ශ්‍රී ලංකා රුපියල, අනෙකුත් විදේශීය ව්‍යවහාර මුදල් වලට එරෙහිව සියයට පහකින් පමණ පහත වැටීමට හේතු විය. කෙසේ වුවද, 1973 දී නිර්යාත ඉපැයීම්-වලින් වැඩි හරියක් පිළිබිඹු වූයේ විදේශීය මුදල්වලින් නිසා ඉහළ රුපියල් ආදයම් ලැබීම පිළිබඳව ඉහත දක්වූ සාධකය අදළ වන්නේ ආන්තික වශයෙනි. 1972දීවූ එක්සත් ජනපද ඩොලර් 3080 ලක්ෂයේ සිට 1973 දී ඩොලර් 3680 ලක්ෂය දක්වා නිර්යාතයන් වැඩිවී තිබේ. මේ අනුව 1973 දී නිර්යාත ඉපැයීම් කෙරෙහි ජාත්‍යන්තර මිළ සාධකයෙහි වැදගත්කම ප්‍රධාන වශයෙන් බලපෑ බව තහවුරු වෙයි.

1973 දී ශ්‍රී ලංකාවේ ආනයනයන්හි වටිනාකම රුපියල් 21530 ලක්ෂයේ සිට රුපියල් 26440 ලක්ෂය දක්වා සියයට 23 කින් වැඩි විය. 1968 දී ආනයන සීමා කිරීම් ප්‍රතිපත්තියේ කරනු ලැබූ ඇතැම් ලිහිල් කිරීම් සමග 1969 දී වූ ඉතා ඉහළ ආනයන මට්ටමේ සිට ආනයන

---

1. වසර අවසානයේදී සියළුම ගිවිසුම් නිසි ලෙස ක්‍රියාත්මක නොකරන ලද නිසා වසර තුළදී ඇතිකර ගත් අපනයන ගිවිසුම්වල වටිනාකමට වඩා විදේශ විනිමය ඉපැයුම් අඩුවිය.

2. 1973 අයවැය වාර්තාවෙන් - නොවැම්බර් 2 ද සිට සියයට තුනක් දක්වා වැඩි කරන ලදි.

පිළිබඳ දක්නට තිබූ අඩුවීම් උපනතියෙහි තියුණු ආපසු හැරීමකි. මෙම වැඩිවීමෙන් රටට දැරිය හැකි ආනයනයන් සීමා කිරීමේ ප්‍රතිපත්තියේ වෙනසක් අදහස් නොකෙරේ. එය ශ්‍රී ලංකාවේ අත්‍යාවශ්‍ය ආනයනයන් උදෙසා දැරීමට සිදුවූ බෙහෙවින් ඉහළ ගිය මිලයන්හි නොවැළැක්විය හැකි ප්‍රතිඵලයක් විය. මිළ ඉහළ නැගීම් සියළු ශීර්ෂයන් සම්බන්ධව පැතිර ගියද, සීනි, පිටි, සහල්, කිරි ආහාර සහ අතිරේක ආහාර ද්‍රව්‍ය වැනි අත්‍යාවශ්‍ය ශීර්ෂ සම්බන්ධ මිළ ඉහළ යාම් බෙහෙවින්ම විශාල විය. එක් අතකින් මිලයන් ලෝක සැපයුමෙහි සීමාකාරී තත්ත්වයන් නිසා මෙතෙක් පැවතියාට වඩා වර්ෂය පුරා බෙහෙවින් ඉහළ මට්ටමක වූ අතර අනෙක් අතින් ව්‍යවහාර මුදල් යළි-ඇදීම සමග නැව් සමාගම් විසින් පැනවූ අධිගාස්තු කීපයක් නිසා ඉහළ ගිය නැව් ගාස්තුද මීට හේතු විය.

වර්ෂය තුළදී ආනයන මිළ දර්ශකය ( 1967=100 ) 158 සිට 209 දක්වාද, මේ අතරින් ආහාර දර්ශකය 173 සිට 233 දක්වාද ඉහළ ගියේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස ඇත්ත වශයෙන්ම ආනයන පරිමාමේ අඩුවීමක් ඇති විය. මෙය 1972 දී 88 සිට 1973 දී 79 දක්වා අඩුවූ ආයාත පරිමා දර්ශකය ( 1967=100 ) මගින් පෙන්නුම් කෙරේ. ලබා ගත හැකි සම්පත්වලින් කළ යුතු පළමු කාර්‍ය්‍ය පරිභෝජන ආනයනයන් සම්බන්ධව තීරනාත්මක මට්ටමක් පවත්වා ගැන්ම වීම නිසාත්, විශාල වශයෙන් ආනයනය කළ යුතු ආහාර ශීර්ෂයන් සම්බන්ධ මිළ ඉහළයාම් වඩා විශාලවීම නිසාත්, 1973 දී ආහාර ආයාතයන් සියයට 44 සිට සියයට 52 දක්වා වැඩිවිය. මේ හේතුකොට ගෙන අතරමැදි සහ ප්‍රාග්ධන භාණ්ඩ ආයාතයන්ගේ සාපේක්ෂ කොටස් පිළිවෙලින් සියයට 26·9 සහ සියයට 27·2 සිට සියයට 24·2 සහ සියයට 20·7 දක්වා අඩුවිය.

(ආ) සේවා සහ සංක්‍රාමයන්

ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂයෙහි සේවා ගිණුම සම්ප්‍රදායිකව හිඟතාවයක් පෙන්නුම් කරමින් තිබේ. 1965 සිට 1968 දක්වා වර්ෂයන් ඊට ව්‍යතිරේකී තත්ත්වයක් සැපයුවද මෙය ඇතැම් ගෙවුම් කාණ්ඩයන් සඳහා පැනවූ, උදාහරණයක් ලෙස ලාභ හා ලාභාංශ මත පැනවූ තහනම වැනි සීමා කිරීම් මගින් බොහෝ දුරට පැහැදිළි කෙරේ. 1969 සිට මෙපිටට, හිඟය යළිත් පැන නැගීම පූර්ව උපනතිය හා ගැලපෙනවා පමණක් නොව ඊට අතිරේක වශයෙන් පසුගිය වර්ෂ කීපය තුළදී කිරීමට නොහැකිව තිබූ ගෙවුම් ගණනාවක් මගින් වර්ධනය කරනු ලැබූවක්ද විය. මෙම පසුබිම තුළ, 1973 දී ගෙවුම් සම්බන්ධව අතිරේක සීමා කිරීම්හි අවශ්‍යතාවකින් තොරව සේවා ගිණුමේ ගනුදෙනුවලින් පැන නැගි රුපියල් 570 ලක්ෂයක අතිරික්තය දිරිගන්වන සුළු සළකුණකි. සංඛ්‍යාත්මක වශයෙන් ඓතිහාසික උපනතීන්ගෙන් අපේක්ෂා කළ හැකිව තිබෙන පරිදි සේවාවන් සම්බන්ධ මුළු ගෙවුම බෙහෙවින් සමාන මට්ටමක නොවෙනස්ව පැවත තිබෙන මුත් ලැබීම් පෙර වර්ෂවල මට්ටම්වලට වඩා සැළකිය යුතු වැඩිවීමක් පෙන්වයි. අතිරික්තයෙහි මූලික මූලය දක්නට ලැබෙන්නේ මෙම පසුව කී සිදුවීමෙහිය. විශේෂිත වශයෙන්ම අනෙකුත් පරිවාහ ගිණුමේ ( ප්‍රධාන වශයෙන් නැව් සහ අහස් යාත්‍රා සඳහා තෙල් සැපයුම හැර වරාය සේවා ) සහ ගමනාගමන රුපියල් 540 ලක්ෂයක මුළු ප්‍රමාණයක් වන සැළකිය යුතු වැඩිවීම් පෙන්වයි. මේ හැර මීට කුඩා ලැබීම් සමස්තව තවත් රුපියල් 510 ලක්ෂයක් එකතු කර තිබේ.

1971 රට තුළ ඇතිවූ කළබලකාරී තත්ත්වය මගින් බාධා පැමිණුනු සංචාරකයන්ගේ පැමිණීමේ වර්ධනයෙහි ඉහළ යාමේ උපනතිය 1973 දීද බෙහෙවින් තියුණු වේගයකින් නොකඩවා සිදුවිය. මෙය 1973 ඉපැයුම් 1972 ට වඩා දෙගුණයකටත් වැඩිවීමෙන් පෙන්නුම් කෙරේ. මෙම වැඩිවීම රට නරඹන සංචාරකයන්ගේ සංඛ්‍යාව ඉහළ නැගීම සහ එක් සංචාරකයකුගෙන් ලැබෙන ඉපැයුම්හි ඉහළ නැගීම් යන හේතු දෙකෙහිම ප්‍රතිඵලයකි. ශ්‍රී ලංකාව නරඹන සංචාරකයන්ගේ සංඛ්‍යාව 1972 දී 56,047 සිට 1973 දී 77,888 දක්වා සියයට 39 කින් වැඩිවිය. මෙම සංවර්ධනය, සංචාරයකින් විශාල සංඛ්‍යාවක් ඇදගැනීමට සහ ඔවුන්ගේ අවශ්‍යතායන් ඉටුකිරීමට ඇතිකල පොදු කාර්‍ය්‍ය පිරිවැය පහසුකම්වල ප්‍රසාරණය සමග අත්වැල් බැඳගත්තේය. සංචාරක හෝටල්වල නැවතීම පිළිබඳ අනුපාතය සහ ඒවායේ කටයුතු සම්බන්ධ සමප්‍රභේදන ලක්ෂණයන් කරා

වේගයෙන් ළඟාවීම යන කරුණු අනුව බැලීමේදී වර්ධනය වන ඉල්ලුම සපුරාලීමට වඩා ඉහළ ධාරිතාවන් සැපයීමට ඉඩකඩ ඇති බව පෙනේ. කෙසේ වෙතත්, අහස් යානා ගමන් කටයුතු සම්බන්ධව බල ශක්ති අර්බුදයේ බලපෑම මගින් ජාත්‍යන්තර සංචාරක ව්‍යාපාරය සම්බන්ධව කිසියම් අවිනිශ්චිතතාවක් හඳුන්වා දී තිබේ.

## II (උ) 4 වෙනි සංඛ්‍යා සටහන

### සේවා ගිණුමේ ප්‍රධාන අංශ වල වූ වෙනස් වීම්

### 1972 සහ 1973

රුපියල් දශලක්ෂ

| | බැර | | | හර | | | ශේෂය | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1972 | 1973(අ) | වෙනස | 1972 | 1973(අ) | වෙනස | 1972 | 1973(අ) |
| වරාය ප්‍රවාහණ සහ රක්ෂණ .. | 154 | 177 | + 23 | 61 | 62 | + 1 | + 93 | +115 |
| විදේශ සංචාර .. | 28 | 59 | + 31 | 12 | 10 | − 2 | + 16 | + 49 |
| ආයෝජන ආදයම් .. | 10 | 17 | + 7 | 125 | 127 | + 2 | −115 | −110 |
| (i) ලාභ සහ ලාභාංශ .. | 1 | 1 | — | 23 | 19 | − 4 | − 22 | − 18 |
| (ii) පොළී .. | 9 | 16 | + 7 | 102 | 108 | + 6 | − 93 | − 92 |
| රජයේ වියදම් .. | 33 | 33 | — | 20 | 20 | — | + 13 | + 13 |
| විවිධ සේවා .. | 83 | 103 | + 20 | 105 | 115 | +10 | − 22 | − 12 |
| පෞද්ගලික සංක්‍රාම .. | 24 | 48 | + 24 | 50 | 46 | − 4 | − 26 | + 2 |
| එකතුව .. | 332 | 437 | +105 | 373 | 380 | + 7 | − 41 | + 57 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලිකයි.

මෑත වර්ෂවලදී නිරතුරුවම ඉහළ මට්ටමකවූ වරාය වියදම්වලින් ලැබීම (නැව්වල අවශ්‍යතාවන් සැපයීම, වරාය ගාස්තු, අළුත්වැඩියා පහසුකම්) 1973 දීද 1972 දී වූ රුපියල් 1000 ලක්ෂයක අතිරික්තය සමග සැසඳීමේදී 1973 දී රුපියල් 1140 ලක්ෂයක ශුද්ධ අතිරික්තයක් සටහන් කරමින් තවදුරටත් වැඩිවීමක් පෙන්වා තිබේ.

ප්‍රධාන වශයෙන්ම දිවයින තුළට ගලා එන සහ ඉන් පිටතට ගලා යන පෞද්ගලික විගමනිකයන්ගේ සංක්‍රාමයන් සහ දීමනා ලැබීම්වලින්ද සමන්විත වන ගෙවුම් ශේෂයේ සංක්‍රාම ගෙවුම් ගිණුම, විදේශයන්ට පෞද්ගලික සංක්‍රාමයන් විනිමය පාලනය මගින් සීමා කළ 1950 ගණන්වල අවසානයේ පමණ සිටම ගෙවුම් ශේෂයට නොකඩවා උපකාරී වී තිබේ. පෞද්ගලික ගිණුමෙන් පිටතට ගලා යන ප්‍රමාණයන් නිශ්චය වශයෙන්ම සමහන් කරනු ලබන වඩා වැදගත් ශීර්ෂය වන දීමනාහි උපනති හැසිරීමක් පෙන්වා නොමැත. මීට හේතුව එය ගෙවුම් ශේෂයට සහාය සඳහා දේශීය ප්‍රතිපත්තිවලට වඩා ආධාර දෙනු ලබන රටවල ආධාර ප්‍රතිපත්ති සහ ගෙවුම් ශේෂ තත්ත්වය විසින් බලපෑම් ලැබ ඇති බැවිනි. 1973 දී ආධාරයන්හී දීමනා රුපියල් 830 ලක්ෂයක්වූ අතර, පූර්ව වර්ෂයන් දෙකෙහි එය රුපියල් 1000 ලක්ෂයක් සහ රුපියල් 1050 ලක්ෂයක් විය. අනෙක් අතින් විශේෂයෙන්ම රට තුළට ගලා එන පෞද්ගලික සංක්‍රාමයන් වැඩිවීමක් පෙන්වා තිබේ. මෙයද බෙහෙවින්ම විවිහිස අනුපාතිකයට අතිරේකව විශේෂ ගිණුම් ක්‍රමය වැනි තවත් සානුබලයන් මගින් විදේශයන්හි සේවයේ නියුක්තව ඇති මෙරට වැසියන්ගේ ප්‍රේෂණයන් නිල අංශය තුලින් මෙරටට එවීම ඉහළ නැංවීම අරමුණු කරගත් නිල ප්‍රතිපත්තියේ ප්‍රතිඵලයකි. මුදල් ඇමතිතුමා විසින් සිය අය වැය කථාවේදී කරනු ලැබූ යෝජනාවක් අනුව 1971 පෙබරවාරි මසදී ආරම්භවූ මෙම ක්‍රමය, ඔවුන් විසින් කරනු ලබන ඉච්ඡානුග ප්‍රේෂණයන් සම්බන්ධව සහනයන් සැපයීම තුළින් විදේශයන්හි සේවයේ නියුක්තව සිටින මෙරට ජාතිකයන්ගේ සුළු ඉතුරුම් සංචලනය කිරීමට අදහස් කරනු ලැබිණ. විදේශ ගමන් බලපත්‍ර (තීතිය) සහ මෙරටින් පිටවීම සම්බන්ධ අවසර පණත

යටතේ විදේශයන්හි රැකියාවන් අපේක්ෂා කරන ජාතිකයන්ට ඔවුන්ගේ ඉපැයීම්වලින් සියයට 10 දක්වා ප්‍රමාණයක් මෙරටට එවීම අවශ්‍ය වේ. පෞද්ගලික සංක්‍රාමයන් මෙරටට ගලා ඒම මෙන්ම පිටතට ගලා යාමත්, ඉන්දු-ලංකා ගිවිසුම යටතේ මෙරට පුරවැසියන් නොවන්නන් ආපසු මෙරටින් පිට කිරීමේ වේගය වැඩිවීම හේතුකොට ගෙන, ඉහළ මට්ටමකින් පැවතිණි.

සේවා ගිණුම සමග සංක්‍රාම ගෙවුම්, ගිණුම් ගෙවුම් ශේෂයේ අදෘශ්‍ය සංරචකයට අයත් වේ. අදෘශ්‍ය ගිණුමෙහි ශේෂය හිඟයක් හෝ අතිරික්තයක් පෙන්වයිද යන කරුණු අනුව, වෙළඳ ගනුදෙනු වල අවාසිදායක ප්‍රතිවිපාකය වැඩි කිරීමට හෝ අවම කිරීමට ඊට පුළුවන. 1964 සිට 1968 දක්වා කාලච්ඡේදය තුළදී වර්තන ගිණුමේ සමස්ත ශේෂය අඩු එකක් කරනු සඳහා වෙළඳ ශේෂයේ අවාසිදායක බලපෑම් අඩු කරන අන්දමේ බලපෑමක් අදෘශ්‍ය ගිණුම ඇති කරනු ලැබ ඇත. 1969 සහ 1970 දී එහි කාර්‍ය්‍ය මීට ප්‍රතිවිරුද්ධ වූවක්වූ අතර වෙළඳ ගනුදෙනු මගින් පෙන්නුම් කළ හිඟයන්ට වඩා විශාල හිඟයක් හට ගනු ලැබිණ. මෙය ප්‍රධාන වශයෙන්ම ඒ සම්බන්ධ සීමා කිරීම් ලිහිල් කිරීම හේතුකොට ගෙන ආයෝජන ආදායම් සම්බන්ධව ගලා යාම් වැඩිවීම සහ ඉහළ යමින් පවතින විදේශ ණය සම්බන්ධ සේවා ගෙවුම් වැඩිවීම යන හේතු නිසා සිදුවූවකි. කෙසේ වෙතත් 1971 සිට අදෘශ්‍ය ගිණුම වෙළඳ ශේෂයේ අවාසිදායක ප්‍රතිවිපාකයන් ලිහිල් කිරීමේ එහි පළමු කාර්‍ය්‍ය ඉටුකරනු ලැබීය. 1973 වර්ෂය තියුණු ලෙස වැඩිවූ අතිරික්තයන් පෙන්වූ නිසා මෙම වාසිදායක උපනතියේ තවදුරටත් වැඩි දියුණුවීමක් සටහන් කරයි. 1971 සහ 1972 අතිරික්තයන් වූ රුපියල් 710 ලක්ෂය සහ 590 ලක්ෂය සමග සැසඳීමේදී මෙම අතිරික්තය රුපියල් 1380 ලක්ෂයක් විය. අදෘශ්‍ය ගිණුමේ වැඩිදියුණුවූ තත්ත්වය නිසා වැඩිවූ වෙළඳ හිඟයෙහි අවාසිදායක ප්‍රතිවිපාකය අඩුවූ අතර වර්තන ගිණුමේ හිඟය රුපියල් 1610 ලක්ෂය දක්වා අඩු කරනු ලැබීය.

(ඇ) ප්‍රාග්ධන ගිණුම

1973 දී ශ්‍රී ලංකාවට රුපියල් 1,5180 ලක්ෂයක සම්පත් පරතරයක් පියවීමට තිබුණි. මෙය රුපියල් 1,0000 ලක්ෂයකට වඩා වැඩි සම්පත් පරතරයක් හටගත් 1969 සිට දක්නට ලැබුනා වූ රටාවක් දිගටම පැවතීමක් වූ අතර, 1973 මෙම පරතරය මෙතෙක් වාර්තා වූ ඉහළම සංඛ්‍යාව වේ. මීට ප්‍රධාන වශයෙන් හේතු වූ සාධකයන් නම්, ආයාතයන් සම්බන්ධ ඉහළ පැහැදම් සහ විශේෂයෙන්ම කෙටි සහ මැදි කාලීන වැඩිවන ණය සේවාකරණ ගෙවුම්ද, ඊට තරමක් අඩු වැදගත්කමකින් යුක්ත වූ බැංකු ණය ආපසු ගෙවීම් සහ විදේශ වත්කම් ගොඩනැංවීමත්ය.

II (උ) 5 වන සංඛ්‍යා සටහන

විදේශීය සම්පත් පරතරය පියවීමට මුදල් ලබාගත් මාර්ග

1972 - 1973

| | 1972 | | 1973 (අ) | |
|---|---|---|---|---|
| | රු. දශලක්ෂ | ප්‍රතිශත කොටස | රු. දශලක්ෂ | ප්‍රතිශත කොටස |
| සම්පත් පරතරය .. | − 1,291 | | − 1,518 | |
| මුදල් සපයාගත් ආකාරය .. | + 1,257 | 100·0 | + 1,516 | 100·0 |
| 1. විදේශ වත්කම් .. | − 229 | − 17·7 | − 125 | − 8·2 |
| 2. විදේශ බැංකු ණය .. | 12 | 1·0 | — | — |
| 3. ජා. මූ. අ. කළ හැර ගැනීම් .. | 163 | 12·6 | 137 | 9·0 |
| 4. ද්විපාර්ශ්වික වෙළෙඳ ශේෂ .. | − 11 | 0·9 | 1 | 0·1 |
| 5. කෙටි කාලීන වෙළෙඳ ණය .. | 593 | 45·9 | 781 | 51·4 |
| 6. සැපයුම්කරුවන්ගේ ණය .. | 52 | 4·0 | 240 | 15·8 |
| 7. ද්‍රව්‍යාධාර .. | 304 | 23·6 | 210 | 13·8 |
| 8. යෝජනාක්‍රම ආධාර .. | 98 | 7·6 | 125 | 8·2 |
| 9. අනෙකුත් ණය සහ ණය මාලා .. | 13 | 1·0 | — | — |
| 10. පරිත්‍යාග .. | 100 | 7·7 | 83 | 5·5 |
| 11. පෞද්ගලික ප්‍රාග්ධනය .. | 10 | 0·8 | 6 | 0·4 |
| 12. සෙසු මාර්ග .. | 107 | 8·3 | 48 | 3·2 |
| 13. විශේෂ ගැනීමේ අයිතීන් .. | 62 | 4·8 | — | — |
| 14. වැරදීම් සහ අත්හැරීම් .. | 17 | 1·3 | 12 | 0·8 |

(අ) තාවකාලිකයි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ශ්‍රී ලංකාව මුහුණ දෙමින් සිටින විදේශ ගෙවුම් පිළිබඳ වර්තමාන තත්ත්වය හමුවේ, සම්පත් පරතරය පියවීම සඳහා බෙහෙවින්ම යෝග්‍ය ක්‍රමය වන්නේ දිගුකාලීන ප්‍රාග්ධනයයි. පෞද්ගලික දිගුකාලීන ප්‍රාග්ධනය මෑත වර්ෂවලදී මෙම පරතරය පියවීමේ වැදගත් මූලයක් වී නොමැත. 1971 වූ ඉහළ සංඛ්‍යාවන් වූ රුපියල් 4940 ලක්ෂයේ සිට 1972 දී රුපියල් 4150 ලක්ෂය දක්වා පහත වැටුනු දිගුකාලීන නිල ප්‍රාග්ධන ගලා ඒම 1973 දී තවදුරටත් රුපියල් 3350 ලක්ෂය දක්වා අඩුවිය. රුපියල් 1410 ලක්ෂයක් වන පසුගිය ණය සම්බන්ධයෙන් කල ආපසු ගෙවීම සඳහා ඉඩ හැරි කල ශුද්ධ ගලාඒම රුපියල් 1940 ලක්ෂය දක්වා පහත වැටින. 1972 මට්ටමින් රුපියල් 950 ලක්ෂයක් තරම් විශාල ප්‍රමාණයකින් පහල වැටුණු භාණ්ඩ ආයාතයන්හි මෙම අඩුවීම මුළුමනින්ම පිළිබිඹුවී ඇත. මෙම අඩුවීමට එක් වැදගත් හේතුවක් වූයේ, 1973 දී ආධාර ගිවිසුම් අත්සන් කිරීමේ වූ ඇතැම් ප්‍රමාදයන්ය. ආධාර කමිටුවේ රැස්වීම 1973 මාර්තු මසදී පැවැත්වූවද, ගිවිසුම් වලින් විශාල කොටසක් අත්සන් කරනු ලැබුවේ වර්ෂය අවසානයේදී පමණය. මේ හේතුවෙන් ආධාර වලින් සැළකිය යුතු කොටසක් 1974 වර්ෂය දක්වා විහිදුනි. එසේම මෙයට අනෙක් හේතුව වූයේ, තම රටවල ගෙවුම්ශේෂ ගැටළුව හේතුකොට ගෙන ආධාර දෙනු ලබන වැදගත් රටවල් කීපයක් විසින්ම ආධාර වියදම්හි සිදුකළ පොදු කපා හැරීමයි.

දිගුකාලීන ප්‍රාග්ධන ප්‍රමාණයේ අඩුවීමේ ප්‍රතිඵලය වූයේ, පූර්ව වර්ෂවලදී මෙන්ම නමුත් වැඩි ප්‍රමාණයකින්, සම්පත් පරතරයෙන් විශාල කොටසක් මූල්‍යකරණය පිළිබඳ බර කෙටිකාලීන සහ මැදිකාලීන මූලයන් මත පතිත වීමය සමස්ත වශයෙන් කෙටිකාලීන මූලයන්ගෙන් රුපියල් ලක්ෂ 10210 ක් ලැබුණු අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් තවත් රුපියල් ලක්ෂ 1370 ක් ලැබුණි. වර්ෂය තුළදී කෙටිකාලීන ණය ආපසු ගෙවීම් (කෙටිකාලීන ණය සහ සැපයුම් කරුවන්ගේ ණය) රුපියල් ලක්ෂ 7390 ක් විය. මින් අදහස් වන්නේ, 1972 සහ 1971 දී පිළිවෙලින් සිදුවූ වැඩිවීම් වූ රුපියල් ලක්ෂ 450 සහ 370 සමඟ සැසඳීමේදී ශුද්ධ පදනමක් යටතේ 1973 දී රුපියල් 2820 ලක්ෂයකින් කෙටිකාලීන ණය වැඩිවූ බවය. මෙම කරුණ පමණක් හුදෙක් ගත්කළ, තරමක් විශාල කරුණක් සේ පෙනෙන මුත්, එය විදේශ වත්කම්හි රුපියල් 1250 ලක්ෂයකින් හා විදේශ බැංකු වගකීම් රුපියල් 1420 ලක්ෂයකින් වූ අඩුවීම සම්බන්ධ පසුබිමේ සිට බැලිය යුතු වේ.

1973 දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබාගත හැකිවූ සම්පත් නිර්යාතයෙහි උච්චාවචනයන් හිලව් මුදල් සැපයීම් ක්‍රමය යටතේ ලබාගත් රුපියල් 1370 ලක්ෂයක ප්‍රමාණයකට සීමාවිය. පූර්ව වර්ෂයේ මෙන් නොව, සම්පස්ථ ගිවිසුම් යටතේ ගත් විශේෂ හැර ගැණුම් අයිතිය යටතේ වෙන්කිරීම් පිළිබඳ පහසුකම් හෝ නොවීය. රුපියල් මගින් ගෙවිය යුතුවූ ගාස්තු ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට රුපියල් 120 ලක්ෂයක ප්‍රමාණයක් බැර කරනු ලැබීය. අනෙක් අතින්, පසුගිය වර්ෂවල ගැනුම් සම්බන්ධ ආපසු මිලදී ගැනීම් රුපියල් 1690 ලක්ෂයක් විය. මේ අනුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ශුද්ධ ණයගැතිභාවය 1972 දී වූ රුපියල් 120 ලක්ෂයක වැඩිවීම සමග සැසඳීමේදී 1973 දී රුපියල් 200 ලක්ෂයකින් අඩුවිය.

1973 වර්ෂයේ ප්‍රාග්ධන ගිණුමේ ගනුදෙනු පිළිබඳ කළ මෙම විග්‍රහය විදේශ සම්පත් පරතරයෙන් විශාල කොටසක් කෙටිකාලීන සහ මැදිකාලීන මූලයන්ගෙන් පියවීමට පටන් ගත් 1968 සිට විකාශනය වී තිබෙන පරිදි ශ්‍රී ලංකාවේ විදේශ ගිණුම් තත්ත්වයේ පවතින දුර්වලතාව මතුකර පෙන්වයි. වර්තමාන විදේශ විනිමය ඉපැයුම් වලින් කරනු ලබන පළමු ගෙවීම පසුගිය ණය සම්බන්ධ සේවා ගෙවුම් වන නිසා ආයාතයන්ගේ තීරණාත්මක මට්ටමින් පවත්වාගෙන යාමට ඇති හැකියාව, නව කල්පසුවූ ගෙවීම් පහසුකම් පිළිබඳ එකඟවීම් මත රඳා පවතී.

1974 සඳහා බලාපොරොත්තු තක්සේරු කිරීමේදී, මෙවැනි ප්‍රමාණයක සහ අවශ්‍යවන කාලයක දිගුකාලීන ආධාර ශ්‍රී ලංකාවට ලැබීම ආධාර සපයනු ලබන ආර්ථිකයන්හි ගැටළු මෙන්ම සාමාන්‍ය ක්‍රියාත්මක ප්‍රමාදවීම් යන හේතු දෙකම නිසා අපේක්ෂා කළ නොහැකිය. මේ නිසා කෙටිකාලීන ආධාරයන්හි පිහිට සෙවීම නොවැලැක්විය හැකිවනු ඇත. කෙටිකාලීන උපකාරී කරගැනීම් වැඩිවීමේ ඇති අසතුටුදයක තත්ත්වය පසුගිය වාර්තා වලින් විස්තර කරනු ලැබ ඇති අතර මෙම වාර්තාවේ 1 කොටසින් එවැනි තත්ත්වයන්හිදී ඇතිවිය හැකි අවාසි සහ අනතුරු පිළිබඳව යොමුකළ අවධානය දක්වයි.

II (උ) 6 වැනි සංඛ්‍යා සටහන

**ශ්‍රී ලංකාවේ විදේශීය වත්කම් ***

රු. දශලක්ෂ

| | දෙසැම්බර් 1971 | දෙසැම්බර් 1972 | දෙසැම්බර් 1973 | වෙනස 71/72 | වෙනස 72/73 |
|---|---|---|---|---|---|
| රජය .. | 12·4 | 53·7 | 3·3 | + 41·3 | − 50·4 |
| රජයේ ඒජන්සි සහ ආයතන .. | 62·3 | 67·3 | 70·7 | + 5·0 | + 3·4 |
| ශ්‍රී ලංකා මහ බැංකුව .. | 238·2 | 285·4 | 480·5 | + 47·2 | + 195·1 |
| වාණිජ බැංකු .. | 185·2 | 320·3 | 296·7 | + 135·1 | − 23·6 |
| මුළු ගණන .. | 498·1 | 726·7 | 851·2 | + 228·6 | + 124·5 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

* මහජන චීන ගිණුම් ශේෂ සඳහා සකස්කරන ලදී.

## 2. විදේශීය වත්කම්

ඉහත දැක්වෙන සංඛ්‍යා සටහනින් පෙන්නුම් කරන පරිදි 1973 දී ශ්‍රී ලංකාවේ දළ විදේශීය වත්කම් රුපියල් 1245 ලක්ෂයකින් වැඩි විය. මෙය 1972 රුපියල් 2286 ලක්ෂයක් පමණ විශාල ප්‍රමාණයකින් සිදුවූ වැඩිවීම සමග දක්නට තිබූ උපනතිය දිගටම පැවතීමකි. 1973 අවසානයේදී දළ විදේශ වත්කම් රුපියල් 8512 ලක්ෂයක් වූ අතර, මෙය 1960 සිට වාර්තාගත වූ ඉහළම සංඛ්‍යාවයි. මෙම වැඩිවීම සම්පූර්ණයෙන්ම වාගේ මහ බැංකුවේ වත්කම්හි රුපියල් 1950 ලක්ෂයකින් සිදුවූ වැඩිවීම හේතුකොට ගෙන සිදුවූවකි. මේ අතර, රජය සහ වාණිජ බැංකුවල වත්කම් පිළිවෙලින් රුපියල් 504 ලක්ෂයකින් සහ රුපියල් 236 ලක්ෂයකින් අඩුවිය. රජයේ වත්කම්හි අඩුවීම ඇත්ත වශයෙන්ම මහජන චීන සමූහාණ්ඩුව සමග ඇති ගෙවීම් ගිවිසුම් ගිණුම යටතේ ශ්‍රී ලංකාවට ලැබීමට තිබූ ශේෂය අඩුවීමේ ප්‍රතිඵලයකි.

විදේශ වත්කම්හි මෙම වැඩිවීම, ගෙවුම් ශේෂයේ වැඩිදියුණු වීම් මගින් විස්තර කරනු ලබන්නේ ඉතා සුළු වශයෙනි. මෙම වැඩිවීම වෙළඳ අනුපාතය අඩුවන දිසාවකට පිහිටීම නොකඩවා දක්නට ලැබෙන අවදියක හටගත් හෙයින්, එක් අතකින් එය ලබා කරගනු ලැබුයේ ආයාත පරිමාවේ කැප කිරීමක් තුලින් සහ අනෙක් අතින් කෙටිකාලීන වගකීම් තවත් සමුච්චනය තුලිනි. 1973 දී රජයේ[1] කෙටිකාලීන වගකීම් රුපියල් 2530 ලක්ෂයක වැඩිවීමක් සටහන් කළ නමුත්, මහ බැංකුවේ සහ වාණිජ බැංකුවල මෙම වගකීම් පිළිවෙලින් රුපියල් 720 ලක්ෂයකින් සහ 700 ලක්ෂයකින් අඩුවිය. මේ අනුව, ශ්‍රී ලංකාවේ කෙටිකාලීන වගකීම් ශුද්ධ පදනමක් යටතේ 1973 දී රුපියල් 1110 ලක්ෂයකින් වැඩිවිය.

### පරිවර්ත්‍ය රුපියල් ගිණුම් ක්‍රමය

පරිවර්ත්‍ය රුපියල් ගිණුම් ක්‍රමය සම්ප්‍රදායික නොවන ස්වරූපයේ විශේෂයෙන්ම මැණික් නිර්යාතයන් ඉහළ නැංවීමට අතිරේක සානුබලයක් වූ අතර, එවැනි ඉපැයීම් නිල මාර්ගයන් කරා යොමු කරවීමට පොළඹවනු ලබන්නක් විය. මෙම ක්‍රමය යටතේ සම්ප්‍රදායික නොවන හෝ සුළු නිර්යාත නිෂ්පාදිත සහ සමහර සේවා නිර්යාතකයන්ට ඔවුන්ගේ ඉපැයීම් වලින් කිසියම් ප්‍රතිශතයක් පරිවර්ත්‍ය රුපියල් ගිණුමකට බැර කිරීමට අවසර දෙනු ලැබීය. මෙසේ බැරකරනු ලබන ප්‍රමාණය ආයාත සහ නිර්යාත පාලක විසින් බලපත්‍ර නිකුත් කරනු ලබන ආයාතයන් උදෙසා ගෙවීම් කිරීමටත් එසේම විනිමය පාලකගේ පූර්ව අනුමැතිය සිදුකරන විදේශ සංචාර වැනි තවත් ඇතැම් අදෘශ්‍ය ගෙවුම් සිදු කිරීමටත් උපයෝජනය කළ හැකි වේ. මෙම පහසුකමට ප්‍රථමයෙන්ම හිමිකම් කීවේ 1972 ජූලි මස 11 දින සිට මැණික් නිර්යාතයන් ය. එම ඉපැයීම් වලින් සියයට 25 ක් පරිවර්ත්‍ය රුපියල් ගිණුමට බැර කරනු ලැබීමට ඉඩ දෙනු ලැබිණ. 1973 ආරම්භයේ සිට මෙම පහසුකම පුද්ගලයන් විසින් කරනු ලබන සිත්තම්,

1. කෙටිකාලීන ණය, සැපයුම්කරුවන්ගේ ණය සහ බැංකු ඒජන්තවරුන්ගේ හර ශේෂයද ඇතුළත් වන පරිදි නිර්වචනය කරනු ලැබේ.

නිර්මාණ සහ අනෙකුත් පුද්ගලික කලකෘතීන් සහ සාහිත්‍යමය සහ විද්‍යාත්මක ලේඛන සහ විදේශයන්හි ප්‍රසිද්ධ කිරීම සඳහා යවන රචනා සහ වෘත්තීය සහ උපදේශක සේවාවන්ගේ ඉපැයීම් සහ නිර්යාත ඉපැයුම් ඇතුළත් වන පරිදි පුළුල් කරනු ලැබීය. අනෙකුත් මුළු අපනයන භෝග සම්බන්ධව පරිවර්ත්‍ය ගිණුමේ බැර කිරීමට හැකි කොටස වර්ෂය ආරම්භයේ සිට නොවැම්බර් මස 2 වෙනි දින දක්වා සියයට 2 ක්ද, ඉන්පසු සියයට 3 ක්ද විය.

1973 දෙසැම්බර් අවසානය දක්වා බලයලත් වෙළඳුන් සමග විවෘත කරනු ලැබූ පරිවර්ත්‍ය රුපියල් ගිණුම් සංඛ්‍යාව 709 ක්වූ අතර, මුළු බැර කිරීම් රුපියල් 542 ලක්ෂයක්ද, මුළු හර කිරීම් රුපියල් 226 ලක්ෂයක්ද විය. විවිධ කාණ්ඩයන්ගෙන් පරිවර්ත්‍ය රුපියල් ගිණුම් සඳහා බෙහෙවින්ම ඇදී ගොස් ඇත්තේ මැණික් නිර්යාතයන්ය. ඔවුන්ගේ බැර කිරීම් රුපියල් ලක්ෂ 465 ක් හෙවත් මුළු බැරකිරීම් වලින් සියයට 85.8 ක් විය.

අනෙකුත් සම්ප්‍රදායික නොවන නිර්යාත සහ සංචාරක ව්‍යාපාරය පිළිවෙලින් රුපියල් 68 ලක්ෂයකට සහ රුපියල් 9 ලක්ෂයකට හිමිකම් කිය. වෙනත් ඕනෑම පූර්ව වර්ෂයක ප්‍රමාණයන් හා සැසඳීමේදී, 1973 දී මැණික් නිර්යාත ඉපැයුම්හි රුපියල් 1300 ලක්‍ෂය දක්වා තියුණු වර්ධනය පරිවර්ත්‍ය ගිණුම් පහසුකම නිර්යාත පරිමාව ඉහළ නැංවීමට පමණක් නොව එම නිර්යාතයන් නිල මාර්ග වෙතින් සිදුකරනු ලැබීමටද බලවත් අනුබලයක් සපයා තිබෙන බව පෙනේ.

පරිවර්ත්‍ය රුපියල් ගිණුම් හර කිරීම් වලින් ඉතා විශාල ප්‍රමාණයක් ආයාතයන් උදෙසා ගෙවීම් වලින් සමන්විත වේ. රුපියල් 226 ලක්ෂයක්වූ මුළු හර කිරීම් වලින් රුපියල් 191 ලක්ෂයක් ආයාත සම්බන්ධ වූ අතර, විදේශ සංචාර සහ දේශීය වියදම් සඳහා කළ හර කිරීම් පිළිවෙලින් රුපියල් 30 ලක්ෂයක් සහ රුපියල් 5 ලක්ෂයක් විය. 1973 මාර්තු 1 දින සිට 1973 දෙසැම්බර් 31 දක්වා ආයාත සහ නිර්යාත පාලක විසින් නිකුත් කළ ආනයන බලපත්‍ර අනුව පෙනීයන්නේ ආයාත ගෙවුම් වලින් වැඩි කොටසක් කාර්මික අමු ද්‍රව්‍ය සහ වෙළඳ සලාක ශීර්ෂයන් සඳහා වූ බවයි. කාර්මික අමු ද්‍රව්‍ය සඳහා ගෙවුම් රුපියල් 57 ලක්ෂයක්ද වෙළඳ සලාක සඳහා ගෙවුම් රුපියල් 87 ලක්ෂයක්ද විය. මෝටර් වාහනය ආයාතය උදෙසා උපයෝජනය කළ පරිවර්ත්‍ය රුපියල් ප්‍රමාණය රුපියල් 35 ලක්ෂයක් හෙවත් නිකුත් කළ මුළු ආයාත බලපත්‍ර වල වටිනාකමින් සියයට 17 ක් වේ. මේ අනුව, පරිවර්ත්‍ය රුපියල් වලින් වැඩි කොටසක් පරිභෝජනයට වඩා සංවර්ධන අරමුණු උදෙසා උපයෝජනය කර තිබෙන බව පැහැදිලිය.

**විදේශ ණය**[1]

ශ්‍රී ලංකාවේ විදේශ ණය සම්බන්ධ සේවා ගෙවුම් 1973 දී රුපියල් 5126 ලක්ෂයක් වූ අතර, පූර්ව වර්ෂයේදී එය රුපියල් 4802 ලක්ෂයක් විය. ( II (උ ) 7 වැනි සංඛ්‍යා සටහන බලන්න ) 1973 ණය සේවා වියදම ණය හිලව් කිරීම හා සම්බන්ධ වූ රුපියල් 1084 ලක්ෂයකින්ද සමන්විත විය, 1972 වර්ෂය සඳහා සංසන්දනාත්මක සංඛ්‍යාවන් පිළිවෙලින් රුපියල් 3783 ලක්ෂයක් සහ රුපියල් 1019 ලක්ෂයක්ද විය.

---

1. මහ බැංකුව වැනි රජයේ නොවන මූල්‍ය ආයතනයන්ගේ විදේශීය ණයගැතිභාවය ඇතුලත් කර තිබෙන නිසා මෙම කොටසෙහි ඉදිරිපත් කර ඇති දත්තයන්, රාජ්‍ය මූල්‍ය අංශය මගින් ඉදිරිපත් කර ඇති දත්තයන්ට වඩා වෙනස් විය යුතුය.

## II (ළ) 7 සංඛ්‍යා සටහන

### විදේශ ණය සඳහා සේවා ගෙවීම් 1969-1973

රුපියල් දශලක්ෂ

| | 1969 | 1970 | 1971 | 1972 | 1973 |
|---|---|---|---|---|---|
| 1. ණය සේවා ගෙවීම් .. | 282·3 | 453·4 | 410·6 | 480·2 | 512·6 |
| (අ) ණය හිලව්කිරීම් .. | 213·9 | 353·7 | 306·1 | 378·3 | 404·2 |
| (ආ) පොලී .. | 68·4 | 99·7 | 104·5 | 101·9 | 108·4 |
| 2. අපනයන භාණ්ඩ හා සේවා සඳහා ඉපයීම් .. | 2,162·8 | 2,253·3 | 2,244·2 | 2,205·9 | 2,733·3 |
| 3. ණය සේවා ප්‍රතිශතය (2 ප්‍රතිශතය 1 වශයෙන්) .. | 13·1 | 20·1 | 18·3 | 21·8 | 18·8 |

මූලය; ශ්‍රී ලංකා මහ බැංකුව

1973 ණය හිලව් කිරීමේ වියදමින් රුපියල් 2637 ලක්ෂයක් හෙවත් සියයට 65·2 ක් වර්ෂය 1-5 ක් වූ අතර පරිණතවීමේ කාලයකින් යුත් ණය සඳහා කළ ආපසු ගෙවීම් වලින් සමන්විත විය. 1972 දී එවැනි ගෙවීම් රුපියල් 2538 ලක්ෂයක් හෙවත් එම වර්ෂයේ ක්‍රමක්ෂය වියදමින් සියයට 67·1 ක් විය.

ණය සේවා අනුපාතය ( භාණ්ඩ සහ සේවා නිර්යාත ඉපැයුම්හි ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කරනු ලබන ණය හිලව් කිරීම් සහ පොළී ගෙවුම් ) 1973 දී සියයට 18·8 ක්වූ අතර, 1972 දී එය සියයට 21·8 ක් විය. සමාලෝචනයට භාජනය වන වර්ෂයේදී මෙම අනුපාතය පහළ වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ රටෙහි ඉපැයුම්හි සිදුවූ වැඩිවීමය.